**පූනාකරෙයි ප්‍රාදේශීය සභාව**
**කිලිනොච්චි දිස්ත්‍රික්කය**

--------------------------------

1 **මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 27 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 08 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට පූනාකරෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

--------------------------

සනාථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම**

---------------------------------------------------------------------

රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව සමාලෝචිත වර්ෂයට අදාලව පිළියෙල කොට ඉදිරිපත් කර ඇති බවට සභාවේ මූල්‍ය ප්‍රකාශන සහතික කර නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයද පිළියෙල කර නොතිබුණි.

1.3.3 **ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබූ එකතුව රු.7,000 ක බදු ආකෘති පත්‍ර ගාස්තු , ආදායම් ගිණුමට නොගෙන විවිධ තැන්පතු ගිණුමට ගෙන තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂයට අදාල තත්‍ය ආදායම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.4 **ගෙවිය යුතු ගිණුම්**

---------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබූ එකතුව රු.148,109 ක් වූ මුද්දර බදු සහ සේවක අර්ථසාධක අරමුදල් සාමාජික ගාස්තු පිළිවෙලින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හා සේවක අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය නොකර 2015 දෙසැම්බර් 31 දිනට විවිධ තැන්පතු ගිණුමේ තබා තිබුණි.

1.3.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

ලබන්නාගේ අත්සන, වැඩ අවසන් කිරීමේ සහතික වැනි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරී හේතු කොටගෙන රු. 45,280 ක් වටිනා ගනුදෙනු 03 කට අදාල ගෙවීම් විගණනයේදී සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

1.3.6 **නීති, රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| III කොටස 24 වගන්තිය | ආණ්ඩුවේ ගැසට් පත්‍රය මඟින් සභාව ස්ථාපිත කර වසර තුනක් ඇතුළත සභාව සතු මාර්ග සහ පටු මාවත් පිළිබඳ නාම ලේඛනයක් ප්‍රසිද්ධ කළයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) අධිකාරිය III රීති 66 | එකතුව රු.282,746 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සභා ලේකම් කටයුතු කර නොතිබුණි. |
| (ii) අධිකාරිය V රීතිය 140 | නියමිත කාලපරිච්ඡේදය තුළදී පියවා නොමැති අත්තිකාරම් සම්බන්ධයෙන් සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (iii) අධිකාරිය IX රීතිය 178(3) | කොන්ත්‍රාත් වැඩ කිරීමට හැකියාවක් ඇති ප්‍රජාමූල සංවිධාන ග්‍රාමෝදය මණ්ඩල පිළිබඳ නම් ඇතුළත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (iv) අධිකාරිය IX රීතිය 178(5) | ලංසු පත්‍රිකා භාරදීම සඳහා සභාපතිවරයා විසින් බලය ලබාදී ඇති නිලධාරියා විසින් හෝ ලේඛනගත තැපෑලෙන් එම ලංසු පත්‍රිකා යවා නොතිබුණි. |
| (v) අධිකාරිය IX රීතිය 180 | ගබඩා සහ මුදල් සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ගෙන් ඇප මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

--------------------------------------

| | | |
|---|---|---|
| I | මුදල් රෙගුලාසි 396 (ඇ) | රු. 200,820 වටිනා මාස 6 ක් ඉක්මවූ බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| II | මුදල් රෙගුලාසි 571 | අවුරුදු දෙකක් ඉක්මවූ එකතුව රු.3,122,278 ක් වටිනා කල් ඉකුත් වූ තැන්පතු 38 ක් සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 6,665,869 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 4,749,426 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,916,443 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

පෙර වර්ෂයේ ශුද්ධ අතිරික්තය වූ රු.1,047,786 ක් සමඟ සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මූල්‍ය ප්‍රගතිය සැසඳීමේදී රු.3,951,368 ක ශුද්ධ අතිරික්තයක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන මූල්‍ය ප්‍රතිඵලය රු.2,903,582 කින් වර්ධනය වී තිබුණි.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

-------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පෙර වර්ෂයේ කාරක ප්‍රාග්ධනය වූ රු.12,368,903 ක මුදල සමඟ සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ රු.17,109,267 ක කාරක ප්‍රාග්ධනය සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.4,740,364 කින් කාරක ප්‍රාග්ධනය වර්ධනය වී තිබුණි.

### 2.4 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.4.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | - | 246,600 | - |
| බදු හා බදු කුලී | 3,576,650 | 2,140,929 | 542,639 |
| බලපත්‍ර ගාස්තු | 753,400 | 478,263 | - |
| සේවා ගාස්තු | 1,483,500 | 249,656 | - |
| වරෙන්තු පිරිවැය, දඩ හා ගාස්තු | 3,314,500 | 6,130,715 | - |
| වෙනත් ආදායම් | 1,388,330 | 1,517,097 | 4,232,089 |
| ආදායම් ප්‍රදාන | 22,721,324 | 15,372,661 | - |
| එකතුව | 33,237,704 | 26,135,921 | 4,774,728 |

### 2.4.2 සන්නිවේදන කුළුනු සඳහා ගාස්තු

2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉදිකර ඇති සන්නිවේදන කුළුනු 04 කට අදාල ගාස්තු අයකර ගැනීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.4.3 මුද්දර ගාස්තු

වර්ෂ 1 සිට 6 දක්වා වූ කාලපරාසයකට අදාල එකතුව රු. 3,000,719 ක මුද්දර ගාස්තු මුදල ඉඩම් රෙජිස්ටාර් ජනරාල් වරයාගෙන් අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ 1 සිට 5 දක්වා වූ කාලපරාසයක් තුළදී උතුරු පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රදානය කර තිබූ වාහන 21 ක අයිතිය පවරා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 65 වන අතර තත්‍ය කාර්ය මණ්ඩලය 30 කි. ඒ අනුව කාර්ය මණ්ඩල පුරප්පාඩු 35 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. සේවකයන් විසින් ඉටුකළ යුතු කාර්යයන් වලට එය බලපා තිබුණි.

3.2 **වත්කම් කළමනාකරණය**

------------------------------

සභාවේ ට්‍රැක්ටර් 07ක් වසර දෙකක සිට භාවිතා කර නොතිබුනි.

3.3 **ප්‍රමාද වූ ව්‍යාපෘති**

--------------------

සමාලෝචිත වර්ෂය තුළදී සභාව විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 13 ක වටිනාකම වූ රු. 2,247,954 එම ව්‍යාපෘති නිමකර නොතිබියදී විවිධ ණය හිමියන් යටතේ ප්‍රතිපාදනය කර තිබූ අතර එය ගිණුම්වල වියදමක් වශයෙන් දක්වා තිබුණි.

3.4 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

සභා බල ප්‍රදේශයෙන් ඉවත් කරන ලද කැලි කසල පිළිස්සීම සහ පස්වලින් යටකිරීම යන ක්‍රියාමාර්ග පමණක් සභාව විසින් අනුගමනය කර තිබුණි. එසේ වුවද, ප්‍රතිචක්‍රීකරණය හා කොම්පෝස්ට් සෑදීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි.

4 **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

-----------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල ඇස්තමේන්තුගත වියදම් සහ තත්‍ය වියදම අතර රු.7,870,069 සිට රු.11,886 ක විචලනයක් තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී අයවැය ඵලදායි ආකාරයකට භාවිත කිරීම සඳහා සකස්කර නොතිබූ අතර ඇස්තමේන්තු නිසි පරිදි සැලසුම්කර වැඩ සටහන් ගත කර නොතිබුණි. ආදායම් සහ තත්‍ය ආදායම් අතර විචලනය රු.7,348,663 සිට රු.128,767 ක පැවතුණි.

4.2 **විගණන කළමනාකරණ කමිටු රැස්වීම්**

------------------------------------------

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන චක්‍රලේඛය අනුව, සමාලෝචිත වර්ෂය තුළදී අවම වශයෙන් විගණන කමිටු 04 ක්වත් පැවැත්විය යුතු බව සඳහන් වේ. කෙසේ වුවද කිසිදු රැස්වීමකින් පවත්වා නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

i. හිඟ ආදායම් අයකර ගැනීම
ii. වාහන උපයෝජනය
iii. කොන්ත්‍රාත් පරිපාලනය
iv. ආදායම් ලේඛන
v. සේවකයන් අධීක්ෂණය